ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College ආනන්දවිද්‍යාලයAnanda College

**ආනන්ද විද්‍යාලය - කොළඹ 10**

## පළමු වාර පරීක්ෂණය - 2016 6 - ශ්‍රේණිය

**නාට්‍ය හා රංග කලාව**

**කාලය – පැය 1**

➢ <u>ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.</u>

**01)** **පහතින් දැක්වෙන A, B, C, D, E, F, G, H කොටස් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න ( 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි පිළිතුරට යටින් ඉරක් ගසන්න.)**

**A.** මලේ මලේ අර නා මල නෙලා වරෙන්.
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්.

**B.** උඩපල ගත්තත් වට්ටක් කා
බිම පල ගුත්තත් වට්ටක් කා
උඩපල ගත්තත් බිම පල ගත්තත්
පුංචි පුංචි ගෙඩි වට්ටක් කා

**C.** ඉඳිකටු පැංචා, රබ්බඩ අයියා, කෝටු කිතයි යා.

**D.** අපේ ගෙදර කිටි , පුළුන් ගොඩක් වටී

**E.** තොප්පි, තොප්පි, තොප්පි - මං ගෙනාව තොප්පි
හරි ලාබෙට තොප්පි - කවුද ගන්නෙ තොප්පි

**F.** නරි බෑනෝ මේ අහන්න.
දැවැද්දත් අරන් ඔන්න.
අපි ආවා දූ බලන්න.
ගෙට එන්නට දොර අරින්න.

**G.** අනේ ... සීයෙ අමල් බිසෝ - කතන්දරේ ... කියන්නකෝ.

**H.** අහසේ හිරු සඳු - ගස් ද, වැල් ද, පොළොවේ.

**1.** ඔබ අසා ඇති ජන ගීතයක පද දෙකක් ඇතුලත් වන්නේ,

I. A  II. B  III. C  IV. D

**2.** ඔබ අසා ඇති රබන් පදයක් ඇතුලත් වන්නේ,

I. A  II. B  III. C  IV. D

**3.** මහදැනමුත්තාගේ ගෝලයෝ දැක්වෙන්නේ,

I. A  II. C  III. D  IV. F

The National e-Learning Portal for The General Education

4. අපේ ගෙදර සුරතලා ගැන කියවෙන්නේ ,

I. C II. D III. E IV. F

5. තොප්පි වෙළෙන්දා නාට්‍යයේ කවියක් ඇතුලත් වන්නේ ,

I. D II. E III. F IV. G

6. නරිබෑනා නාට්‍යයේ ගීත කණ්ඩයක් ඇතුලත් වන්නේ,

I. D II. E III. F IV. G

7. කතන්දරයක් කියා දෙන්නට කියන්නේ කාටද ?

I. E II. F III. G IV. H

8. ස්වභාව ධර්මයෙන් අපට ලැබුණු දායාද මොනවාදැයි දැක්වෙන්නේ ,

I. E II. F III. G IV. H

02) **9 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා A කොටසේ ඇති ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුරු B කොටසේ දක්වා ඇත. ඒ අනුව ගැලපෙන පිළිතුර තෝරා ඊ තලයක් යොදා යා කරන්න.**

| | | |
|---|---|---|
| 9. | පැරණි මිනිසුන් කියූ කතා. | ළමා නාට්‍ය දෙකකි. |
| 10. | තොප්පි වෙළෙන්දා / පුංචි අපට දැන් තේරේ. | ජන කතා නමින් හැඳින්වේ. |
| 11. | නාට්‍යයක් නැරඹීමෙන් ඇති කරගන්නේ. | වාචික අභිනය. |
| 12. | කටින් වචන කතා කිරීම නාට්‍ය විෂයේදී හැඳින්වෙන්නේ | රස වින්දනය |
| 13. | අතින් යමක් දැක්වීම | නිවසට සොරකු ඇවිත් ඇති විටයි. |
| 14. | මධ්‍යම රාත්‍රියේ නිවසේ බල්ලා බුරන විට ඔබට ඇහෙන්නේ | ශ්‍රාවක පිරිස |
| 15. | හාමුදුරුවන් දේශනා කරන බණ අසා සිටින්නේ | ආංගික අභිනය |

( ලකුණු 30 )

03) හරි වැරදි ලකුණු කරන්න.

1. ජන ක්‍රීඩාවල යෙදීමෙන් සාමූහිකත්වයක් ඇති වේ. (    )
2. නාට්‍යයක් නැරඹීම ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයකි. (    )
3. ගීතයක් රස විඳීම දෘෂ්‍ය මාධ්‍යයකි. (    )
4. අනාසාත්මක ගීතයක් තාලයකට කිව නොහැක (    )
5. ඌරු දඩයමේ ගිය ගමරාල යනු ජන කතාවකි. (    )

( ලකුණු 5 )

04) ඔබ අසා ඇති ඕනෑම කෙටි ජන කතාවක් ලියන්න. (වචන 50 ක් පමණ) ( ලකුණු 10 )

05) ඔබ දන්නා ජන ගීත 02 ක් ලියන්න. ( ලකුණු 10 )

06) ඔබ නරඹා ඇති වේදිකා නාට්‍ය තුනක නම් ලියන්න. ( ලකුණු 5 )

07) ඔබ නරඹා ඇති ළමා නාට්‍ය 02 ක නම් ලියන්න. ( ලකුණු 5 )

The National e-learning Portal for The General Education